# පුරා විද්‍යාත්මක සාධක විකෘති කිරීම

ආචාර්ය මාලිනි ඩයස්

බෞද්ධාගමික පසුබිමක් යටතේ ශ්‍රී ලංකාව තුළ ලෙන්, ගිරි, ටැම් සහ පුවරු මත ලියැවුණු බොහෝ ලේඛන සමකාලීන සමාජයේ විසූ ජනතාවගේ දැන ගැනීම සඳහා ලියන ලද බව මා විසින් මතු කොට දැක්විය යුතු වේ. ක්‍රිස්තු පූර්ව තුන්වන ශත වර්ෂයෙන් පසු බුදු දහම ලක්දිවට හඳුන්වා දීමෙන් පසු මෙම ලේඛන ලිවීම ආරම්භ විය. අශෝක අධිරාජයාගේ පුත් මිහිඳු මහ තෙරුන් වහන්සේ බුදු දහම පතුරුවාලීම සඳහා ලක්දිවට වැඩම කොට පරිනිර්වාණය දක්වා මෙහි විසූ බව පුරාවිද්‍යාත්මක සාධක මගින් අපට සනාථ කළ හැකිය.

අප විසින් හිදිසියේ ඇතිවන සිතුවිලි නිසා කැමති අයුරු පුරාවිද්‍යාත්මක සාධක විකෘති කිරීම නොකළ යුතුවේ. සංචාරක අමාත්‍යාංශයේ රාමායණ සංචාරය විධායක කමිටුවේ සභාපති ඇන්. සී. කේ. කිරිඇල්ල මහතා ශිලා ලේඛන පිළිබඳ විශේෂඥයෙකු නොවූ නමුත් රාමායණය පිළිබඳ සම්මන්ත්‍රණයේදී ඒවා විකෘති කරමින් ප්‍රසිද්ධ දේශනයක් පවත්වා තිබේ.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ආරම්භ කළ තැන් සිට ශිලා ලේඛන වල පිටපත් කිරීමේ ක්‍රමය වූයේ කොළ මත තීන්ත යොදා සුදු කළු ස්පර්ශ ලාංඡන ගැනීමය. හිටපු පුරා විද්‍යා කොමසාරිස් සහ කීර්තිමත් අභිලේඛනඥයෙකු වූ ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා මෙම තීන්ත යොදා පිටපත් කළ ස්පර්ශ ලාංඡන කියවා ලියන ලද ඉන්ස්ක්‍රිප්ෂන්ස් ඔෆ් සිලෝන් 1 වෙළුම වන ශිලා ලේඛන සංග්‍රහයේ ලෙන් ලිපි කාණ්ඩයේ මෙම ලෙන් ලිපි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පළ කොට ඇත.

රාමායණ සංචාරය නම් ඊනියා සම්මන්ත්‍රණයේ කියවන ලද පත්‍රිකාවේ රාමායණ මිථ්‍යාවට ගැලපෙන අයුරින් මහනුවර වේගිරියේ ලෙන් ලිපිය කියවා ඇත. මෙම ලිපියේ සඳහන් කුබකර යන්න ඉංග්‍රීසියෙන් potter ද, සිංහලෙන් කුඹල්කරු ද වන නමුත් එය නමක් වශයෙන් ගෙන දූතක යන නම අහස් යානා නියමුවා යන අර්ථයෙන් පරිවර්තනය කොට දැක්වීය.

මහනුවර දිස්ත්‍රික්කයේ මොලගොඩ විහාර ලෙන් ලිපිය තමාගේ අභිමතය සාර්ථක කර ගැනීම සඳහා විකෘති කොට දක්වා තිබේ. එහි සඳහන් බමන යන්න බිමන වශයෙන් වැරදි සහගතව ගුවන් යානයක නියමුවා වශයෙන් පරිවර්තනය කොට ඇත. කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක අළුලෙන (රහල් ගල) නම් ස්ථානයේ ඇති ලෙන් ලිපිය සුදු තීන්ත ගා විකෘති කොට ඡායාරූප ගෙන මහ රකඩ රවණ පුත (රාවණ රජුගේ පුතා) නම් කොටස ලිපියේ මුලට එකතු කොට ඇත.

සුප්‍රසිද්ධ පුරාවිද්‍යාත්මක ස්ථානයක් වන 1 කාශ්‍යප රජුගේ මාළිගය රාවණ රජුගේ වැඩිමහල් සොහොයුරා වන කුවේර රජුගේ මාළිගය වන ලංකාපුර චිත්‍රකුට මාළිගාව වශයෙන් ප්‍රකාශ කරයි. එසේ කිරීමේදී කාශ්‍යප රජු අලංකාරවත් සීගිරි මාළිගයේ ආලකමන්දාවේ කුවේර මෙන් වාසය කළේය යන මහාවංශයේ දැක්වෙන ගාථාව වැරදි සහගතව වෙනස් කිරීමේ යෙදී ඇත. අනුරාධපුරයේ ඉසුරුමුණි විහාරය රාවණා රජුගේ දෙමව්පියන් වන විශ්‍රවස් මුනි සහ කයිකාලි දෙදෙනාගේ දෙවොල යනුවෙන් සඳහන් කොට එම විහාරයේ පූජනීයත්වය කෙළෙසා තිබෙන බව ද කිව යුතුය.